ලිලී කුණාටුවේ බලය

ලිලී වණ්ඩ මාරුතය බටහිර කියුබාවේ දැඩි ජල ගැලීම් ඇති කරමින්ද, යුකැතන් අර්ධ ද්වීපයේ හා යුකැතන් වෙරළේ මහත් කැළඹීමක් ඇතිකරමින්ද, වේගවත්ව හැමුවාය. ඊට දින හතරක් ගතවන විට සිව්වන කාණ්ඩයේ කුණාටුවක් බවට පත් වූ ඇය ප්‍රචණ්ඩව මෙක්සිකෝවේ බොක්ක හරහා පැමිණ ඇමරිකාවේ ටෙක්සාස් සහ ලුයිසියානා නගර වනසමින් ලක්ෂ ගණනින් වූ ජනතාවට උන්හිටි තැන් අහිමි කරමින් මුරණ්ඩුව ඇදී ගියා ය. මෙම මාරුතය හේතුකොට ගෙන දහස් ගණන් වැසියන්ට රට අභ්‍යන්තරයට පලායන්නට සිදු විය.



"ඇට්ලැන්ටිස්" යානය අභ්‍යවකාශයට පිටත්වීමේ ගමන ද මෙම මාරුතය නිසා කල් දැමිණ. යානය ගුවනට විද හරින කෙනඩි අභ්‍යවකාශ මධ්‍යස්ථානය ලිලී මාරුතයේ ගමන් මාර්ගයේම පිටත පිහිටා තිබූ නමුත් ටෙක්සාස් හි හූස්ටන්වල පිහිටා ඇති යානයේ "මෙහෙවර පරිපාලන මධ්‍යස්ථානය" සෘජුවම මාරුතයට හසුවනු ඇතැයි හඳුනා ගැනිණ.

ඉතාමත් නිවැරදිව ලිලී මාරුතයේ ගමන් මග පුරෝකථනය කළ "ඇමරිකානු ජාතික සුළි සුළං මධ්‍යස්ථානයෙන්" මේ බව නිවේදනය කෙරිණ.

ඒ අනුව හූස්ටන් පාලක මැදිරි සංකීර්ණයේ විදුලි බලය විසන්ධි කළ යුතු විය. නැවත විදුලිය සපයා උපකරණ පණගන්වන ක්‍රියාවලිය දින හතරක් ගතවන ඉතාමත් සැලකිල්ලෙන් කළ යුතු දීර්ඝ වැඩ පිළිවෙලකි.

එහෙත් ලිලී මාරුතයේ තර්ජනය එම කල්තබා වීමට වඩා ප්‍රබල හෙයින් විදුලිය විසන්ධි කිරීමට තීරණය කෙරිණි. පාලක උපකරණ සඳහා අධි ආරක්ෂාවද් සපයා සේවකයන්ද ඉවත් කෙරිණ. පුරෝකථනය කළ පරිදි ම ලිලී ටෙක්සාස් හරහා හමා ගියා ය. කාලගුණයේ අභිතකර බව "මෙහෙවර පරිපාලන මධ්‍යස්ථානයකට" බලපෑම හේතුවෙන් අභ්‍යවකාශ ගමනක් කල් දැමූ ප්‍රථම අවස්ථාව මෙය බව "නාසා"ආයතනය පවසයි.

සැෆිර් - සිම්ප්සන් හානි දර්ශකය

ලිලී හරිකේනය සිව්වන කාණ්ඩයේ කුණාටුවක් ලෙස වර්ග කර ඇත



වර්ගය	1	2	3	4	5
හානිය	අවම	සාමාන්‍ය	තදබල	ඉතා දැඩි	අතිශයින් විපත්තිදායක
සුළඟෙහි වේගය	පැ.කි.මී.120-153	පැ.කි.මී.154- 177	පැ.කි.මී.178-209	පැ.කි.මී. 210-250	පැ.කි.මී. 250 ට වැඩි
රැල්ලෙහි උස	අඩි 4-6	අඩි 6-9	අඩි 9-12	අඩි 12- 18	අඩි 18 ට වැඩි

මූලය – හවායි විශ්ව විද්‍යාලය

හෙළ අරුත් සැකසුම : ධර්මානන්ද REUTERS